# 2023 ජූනි

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

## නිෂ්පාදන සහ සේවා

STATISTICS DEPARTMENT
CENTRAL BANK OF SRI LANKA

**2023 ජූනි මාසයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් ද නිෂ්පාදන ක්‍රියාකාරකම්වල පහත වැටීමක් ද පෙන්නුම් කරන ලදී.**

**නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය, නිෂ්පාදන ක්‍රියාකාරකම්හි පසුබෑම පෙන්නුම් කරමින් 2023 ජූනි මාසයේ දී 47.3ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.** මේ සඳහා සියලුම උප-දර්ශකයන්ගේ මන්දගාමී ක්‍රියාකාරීත්වය හේතු විය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

**47.3**

**2023 ජූනි**

නිෂ්පාදන සහ නව ඇණවුම් පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදන අංශයේ පසුබෑසීම හේතු විය. සමීක්ෂණය සඳහා ප්‍රතිචාර දැක්වූවන්ට අනුව, අඛණ්ඩව පවතින ගෝලීය ඉල්ලුමෙහි අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලදී. කෙසේ වුවද, සිය නිෂ්පාදන සඳහා වන වෙළඳපොළ ඉල්ලුම ඉහල නැංවීම සඳහා සමහර නිෂ්පාදකයින් විසින් භාණ්ඩ මිල අඩු කිරීමත් සමඟම ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයේ නව ඇණවුම් සහ නිෂ්පාදනයෙහි යම් වර්ධනයක් දක්නට ලැබුණි. මේ අතර, නව ඇණවුම් සහ නිෂ්පාදනයෙහි දක්නට ලැබුණු පහත වැටීමට සමගාමීව සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් ද පහත වැටුණි. මෙහිදී, බොහෝ ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරනු ලැබූයේ ඔවුන් අත්‍යවශ්‍ය සේවක පුරප්පාඩු සඳහා පමණක් නැවත බඳවා ගැනීම් සිදු කරන අතර, අවම අමුද්‍රව්‍ය තොගයක් පමණක් පවත්වාගෙන යන බවයි. මේ අතර, මෙම මාසයේදී ද ඇණවුම් අඩු වීමත් සමඟ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය අඩු විය.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචලයය | මැයි. | ජූනි. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | 46.2 | 47.3 | + | **අඩු වේගයකින් පහළ යෑමක්** |
| | | **උප-දර්ශක** | | |
| නව ඇණවුම් | 48.0 | 49.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිෂ්පාදන | 48.0 | 49.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 41.5 | 42.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 43.5 | 43.4 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 48.0 | 48.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ආර්ථික වාතාවරණය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වනු ඇතැයි බලාපොරොත්තුවෙන් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන අංශයෙහි ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂා ඉහළ මට්ටමක පැවතුණි.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2023 මැයි මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.8කින් පහළ යමින් 2023 ජූනි මාසයේ දී 48.8ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

චීනය, ඉන්දියාව, සිංගප්පූරුව සහ රුසියාව යන රටවල පසුගිය මාසයට සාපේක්ෂව 2023 ජූනි මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අඩු වේගයකින් වර්ධනය විය. එසේ වුවද, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය සහ එක්සත් ජනපදය යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පසුගිය මාසයට සාපේක්ෂව 2023 ජූනි මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 ජූලි 14 වන දිනට*

---

[1] *එස්&පී ග්ලෝබල්* (S&P Global) *ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2023 ජූනි මාසයේ දී 56.7ක දර්ශක අගයක් දක්වා තවදුරටත් ඉහළ ගිය අතර, එය 2022 ජනවාරි මාසයේ සිට වාර්තා වූ ඉහළම අගය විය.** මේ සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදු වූ ඉහළ යෑම් හේතු විය. කෙසේ වුවද, ජූනි මාසය තුළ දී නිමකිරීමට නියමිත කාර්යයන් අඛණ්ඩව පහළ ගිය අතර, සේවා නියුක්තිය නොවෙනස්ව පැවතුනි.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**2023 ජූනි**

**56.7**

සේවා අංශයේ නව ව්‍යාපාර පිළිබඳව සලකා බැලීමේ දී, ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, අනෙකුත් පෞද්ගලික සේවා, රක්ෂණ සහ වෘත්තීය සේවා යන උප අංශවල දක්නට ලැබුණු ඉහළ යෑම් සමඟ, 2023 මැයි මාසයට සාපේක්ෂව 2023 ජූනි මාසයේ දී නව ව්‍යාපාර ඉහළ ගියේය.

බොහෝ උප අංශවල දක්නට ලැබුණු ඉහළ යෑම් සමඟ 2023 ජූනි මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම් අඛණ්ඩව වර්ධනය විය. ඒ අනුව, වෙළෙඳපොළ පොලී අනුපාතවල සිදු වූ ක්‍රමානුකූල අඩුවීම හේතුවෙන් මූල්‍ය සේවා උප අංශය වර්ධනයක් පෙන්නුම් කළේය. මීට අමතරව, අනෙකුත් පෞද්ගලික සේවා, අධ්‍යාපන සහ වෘත්තීය සේවා යන උප අංශ ද ජූනි මාසය තුළ ධනාත්මක වර්ධනයන් පෙන්නුම් කළේය. කෙසේ වුවද, හජ්ජ් උත්සව සමය හේතුවෙන් ඇඟලුම් සහ පාවහන් ව්‍යාපාරවල යම් දියුණුවක් දක්නට ලැබුණ ද, තොග සහ සිල්ලර වෙළෙඳාම උප අංශයට අදාළ ව්‍යාපාර ක්‍රියාකාරකම් අඛණ්ඩව පහත වැටුණි.

ජූනි මාසයේ දී, නිමකිරීමට නියමිත කාර්යයන් වැඩි වේගයකින් පහළ ගිය අතර, සේවා නියුක්තිය මැයි මාසයේ වාර්තා වූ මට්ටමෙන් නොවෙනස්ව පැවතුනි.

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | මැයි | ජූනි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **53.5** | **56.7** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 59.3 | 59.4 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 57.4 | 61.9 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 36.6 | 50.0 | + | පහළ යෑමක සිට නොවෙනස්ව පැවතීමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 42.2 | 41.4 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 72.1 | 70.8 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් ජූනි මාසයේ දී අඛණ්ඩව වර්ධනය වූ අතර, මේ සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාතික පහළ දැමීම, ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීම, ආනයන සීමා ලිහිල් කිරීම සහ උද්ධමන පීඩන අඩු වීම හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම්හි අපේක්ෂිත වර්ධනයන් හේතු විය.

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2023 මැයි මාසයේ පැවති 55.5 සිට 2023 ජූනි මාසයේ දී 54.0ක් වාර්තා කළේය.

චීනය, ඉන්දියාව, එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අනුව එම රටවල සේවා අංශය පසුගිය මාසයට සාපේක්ෂව 2023 ජූනි මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 ජූලි 14වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.